**(PB 67)**

**කොටස් හිමිකරුවන් වෙත නිකුත් කෙරෙන චක්‍රලේඛය - අති විශේෂ මහ සභා රැස්වීම**

හිතවත් කොටස් හිමිකරුවනි,

**<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය ඉහළ නැංවීම සහ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම</u>**

1. <u>සමාගම වෙත ලැබුනු ශ්‍රී ලංකා රුපියල් බිලියන 5 ක වටිනාකමින් යුත් කොටස් ශ්‍රී ලංකා රජය වෙත වෙන්කර දීම සඳහා ප්‍රකාශිත ප්‍රාග්ධනය ඉහළ නැංවීම</u>

2024 මාර්තු මස 18 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සාමාන්‍ය කොටස් නික්ෂේපණය කිරීමේ සැලැස්මට අනුව (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0551/604/054-1), සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ යම් තෝරා ගත් ණය ශ්‍රී ලංකා රජය වෙත පවරා දීම සඳහා, ශ්‍රී ලංකා රුපියල් බිලියන 5 ක් වූ ප්‍රමාණයේ ආයෝජන වටිනාකමක් සහිත මුදලක්, ශ්‍රී ලංකා රජය විසින් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම වෙත අතිරේක කොටස් ප්‍රාග්ධනයක් ලෙස නික්ෂේපණය කරනු ලැබ ඇත. ඒ අනුව, මෙම ආයෝජනය පිළිගෙන කටයුතු කිරීම තුළ, අදාළ ගනුදෙනුවේ වටිනාකමට සරිලන පරිදි, නව කොටස් ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය වෙත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් නිකුත් කරනු ලැබීමේ අවශ්‍යතාව මේ වන විට උද්ගතව තිබේ. මෙම කාර්යය **සඳහා, එක් කොටසකට රුපියල් 100/- බැගින්** වූ ප්‍රතිෂ්ඨාවක් අනුව **නව සාමාන්‍ය කොටස් මිලියන 50 ක්** ඇති **කිරීම මගින් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය** ශ්‍රී ලංකා රුපියල් 198,860,665,500 **සිට** ශ්‍රී ලංකා රුපියල් 203,860,665,500 ක් **දක්වා** ඉහළ නැංවීමට **අවශ්‍ය** වේ **යැයි සලකනු ලැබේ.**

ගුවන් සමාගමේ සෘණ වටිනාකම පැහැදිලි කර දීමෙන් පසුව, මුදල් අමාත්‍යාංශය විසින් එක් කොටසකට රුපියල් 100/- බැගින් වූ සාකච්ඡා කළ මිල පිළිගනු ලැබ ඇත.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 9 වන ව්‍යවස්ථාව සමඟ කියැවෙන සමාගම් පනතේ 53 වන වගන්තිය මගින්, මෙලෙස සලකා බැලීමට යටත් කොටස් නිකුතුව වැනි කොටස් නිකුතුවක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට දැනට සිටින කොටස් හිමියන් වෙත පූර්වක්‍රය අයිතියක් සලසා දෙනු නොලබන්නේ ය. එහෙයින්, ශ්‍රී ලංකා රජය විසින් කරන ලද රුපියල් බිලියන 5 ක් වූ මුදල් ගනුදෙනුවේ සාධාරණ වටිනාකම නියෝජනය වනු පිණිස ශ්‍රී ලංකා රජයට කොටස් වෙන් කර දීමට සමාගමට අවසර ඇත.

2007 අංක 7 දරන සමාගම් පනතේ 52 වන වගන්තියේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කරනු ලැබ ඇත්තේ, අදාළ කොටස් නිකුතුවේ එක් කොටසක් රුපියල් 100 බැගින් වූ මුදල් වටිනාකමකින් යුතුව නිකුත් කළ යුතු බවටත්, එවැනි ප්‍රතිෂ්ඨාවක්, අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගම සහ දැනට සිටින සියලුම කොටස් හිමියන් විෂයයෙහි සාධාරණ වන බවටත් ය.

නව සාමාන්‍ය කොටස් නිකුතුවෙන් පසුව, සමාගමේ කොටස් හිමිකම් දැරීම පහත දැක්වෙන පරිදි වනු ඇත:

| | **කොටස් ගණන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 2,034,006,469 | 99.77% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.09% |
| මහජන බැංකුව | 1 | 0.00% |
| වෙනත් | 2,736,509 | 0.13% |

2. **<u>විද්‍යුත් සන්නිවේදනය පිළිගැනීම සඳහා සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම</u>**

කොවිඩ් වසංගතය සහ ඉන් පසුව ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන වාතාවරණය ඇතුළු බාහිර තත්ත්වයන් කිහිපයක් හේතුවෙන්, සමාගම සිය වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම් ප්‍රායෝගික ලෙස / දෙමුහුන් ලෙස 2022 වර්ෂයෙන් පසුව පවත්වන ලද්දේ, "වාණිජ සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා රජය සතු සමාගම්වල වියදම් කළමනාකරණය සහ ව්‍යාපාර තිරසාරත්වය" පිළිබඳ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 04/2022 අනුව සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම සඳහා කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ය.

මහා සභා රැස්වීම් පැවැත්වීමේ පරිපාලන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා කාලය හා පිරිවැය යන කරුණු ද්වයම සැලකිල්ලට ගෙන, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් 'ලිඛිතව' හෝ 'ලිඛිත', 'සාමාජිකයා' සහ 'කොටස් හිමිකරු' යන වචනවල අර්ථ නිරූපණය විෂයයෙහි සංශෝධන යෝජනා කර, ඒ වෙනුවෙන් පහත දැක්වෙන අයුරින් එහි නිර්වචනය පැහැදිලි ලෙස නිශ්චිතව සඳහන් කිරීම පිණිස දැනට පවත්නා 52, 54 සහ 155-161 යන සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්ති සඳහා ආදේශ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි :

ඒ අනුව, මෙහි අමුණා ඇති පරිදි රැස්වීම් දැනුම් දීමෙහි සඳහන් කර ඇති සාමාන්‍ය යෝජනාව සහ විශේෂ යෝජනාව, යෝග්‍ය වේයැයි හඟින්නේ නම්, සම්මත කර ගැනීම සලකා බැලීම සඳහා **2024 ජුනි මස 25 වන අඟහරුවාදා දින ප,ව. 3.00** ට සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ සිට ප්‍රභවය වන සමාගමේ **මාර්ගගත අථත්‍ය අති විශේෂ මහා රැස්වීමක්** කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

**අන්තර්ජාල මාර්ගගත අථත්‍ය රැස්වීම**

අන්තර්ජාලය හරහා මාර්ගගතව පවත්වනු ලබන අති විශේෂ මහා සභා රැස්වීමට සහභාගී වීම සඳහා සියලුම කොටස් හිමියන් සාදරයෙන් කැඳවන්නෙමු. අදාළ ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක යන ලිපිනයෙහි පිහිටි සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙත, අති විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය හතළිස් අටකට (48) නොඅඩු කාලයකට පෙර සමාගමට ලැබෙන සේ හෝ විද්‍යුත් තැපෑලෙන් comsec@srilankan.com හරහා හෝ ෆැක්ස් මගින් (+94) - 197335112 වෙත හෝ සම්පූර්ණ කර එවන ලෙස ඔබ සැමගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

පෙරකලාසි පත්‍රය සහ ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය, **www.srilankan.com** හරහා ලබාගත හැකි ය.

තනි කොටස් හිමියන් හා පෙරකලාසි පත්‍ර හිමියන් සඳහාත්, ආයතනික කොටස් හිමියන් සම්බන්ධයෙන් වන විට, බලයලත් නියෝජිතයින් සඳහාත් පමණක් අන්තර්ජාලයට ලොගින් වීමේ පිවිසුම් තොරතුරු වෙනුවෙන් අවසර දෙනු ලබන අතර එහි අනිසි භාවිතය සම්බන්ධයෙන් සමාගම වගකීම් දරන්නේ හෝ වගවිය යුතු වන්නේ හෝ නැත. අදාළ පිවිසුම් තොරතුරු සමාගම විසින් බෙදාගනු ලබන්නේ, කොටස් හිමියා විසින් වලංගු පෙරකලාසි පත්‍රයක් ඉදිරිපත් කර ඇති අය සමඟ පමණක්ය යන්න පෙරකලාසි පත්‍ර හිමියන් සැලකිල්ලට ගත යුතු කරුණක් බව මෙහිලා කරුණාවෙන් සලකන්න.

රැස්වීමට සහභාගි වීමට නොහැකි වන කොටස් හිමියන් න්‍යාය පත්‍රයේ සඳහන් විෂයන් සම්බන්ධයෙන් තම මනාපය සලකුණු කර ඔවුන්ගේ පෙරකලාසි බලකරු ලෙස තමන්ගේම අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම සඳහා මෙයින් ඔවුන්ව උනන්දු කරවනු ලැබේ.

කොටස් හිමියන්ට ඔවුන්ගේ යම් විමසීම් තිබේ නම්, එකී විමසීම්, ඒවා, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කර අති විශේෂ මහා සභා රැස්වීමේදී ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සකසා ඉදිරිපත් කිරීමට සමාගම් ලේකම්වරියට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි, සමාගමේ ලේකම් කාර්යාලය වෙත, රැස්වීම පවත්වනු ලබන දිනට දින තුනකට (03) නොඅඩු කාලයකට පෙර සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක හෝ comsec@srilankan.com හරහා එවිය හැක.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**
**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම**

Sgd.
**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
**ආයතනික ලේකම් සේවාවන්හී සමූහ ප්‍රධානී / සමාගමේ ලේකම්**

2024 මැයි මස 17 වන දින දීය.